චක්‍රලේඛ අංක: 06/2003

මගේ අංකය: පු.කො.10/30/153/2003
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක.280, කෙලින් වීදිය,
කොළඹ 11.
2003.07.14 දින.

උතුරු නැගෙනහිර පළාත් හැර
සෙසු සියලුම පළාත්වල ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්.

විකුණුම්, තෑගිකර වැනි ස්ථිර පැවරුම් ඔප්පුවල මුල්
පිටපතට රු.1/= ක් වටිනා මුද්දර ඇලවීම

2002 අංක.11 දරන මුදල් (සංශෝධිත) පනත මගින්, 1982 අංක.43 දරන මුද්දර ගාස්තු පනත යටතේ අය කරන ලද මුද්දර ගාස්තු 2002.05.01 දින සිට අහෝසි කිරීම නිසා, එකී පනතේ 12 වගන්තිය යටතේ සාධක පත්‍රවල මුල් පිටපතට අය කළ රු.1/= මුද්දර ගාස්තුවද ගෙවීම අනවශ්‍ය වේ. නමුත්, එය අදාල වන්නේ මධ්‍ය රජයට මුද්දර ගාස්තු අයවෙන සාධක පත්‍ර සම්බන්ධයෙන් පමණි.

02. මේ නිසා, පළාත් සභාවලට මුද්දර ගාස්තු අයවෙන, ~~විකුණුම්කර, තෑගිකර~~ වැනි පැවරුම් ඔප්පුවල මුල් පිටපත සඳහා රු.1/=ක් වටිනා ඒ ඒ පළාත් සභාවලට අදාල මුද්දරයක් අලවා තිබිය යුතු බව කාරුණිකව දන්වමි. එසේ නැතහොත්, රුපියල් එකක මුද්දර ගාස්තුවක් ඒ ඒ පළාත් සභාව විසින් නියම කර ඇති බැංකුවකට ගෙවා තිබිය යුතු වේ.

03. කරුණාකර මේ අනුව ඔබ ප්‍රදේශයේ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් දැනුවත් කර අවශ්‍ය කටයුතු කරන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්. - දැ.ගැ.පි.
2. සියලුම පළාත් ආදායම් කොමසාරිස්වරුන්. - දැ.ගැ.පි.

කවි/09.